# ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික නිලධාරින්ගේ සංගමයේ ව්‍යවස්ථාව

මෙම සංගමය, වෘත්තිය සමිති අංඥා පණතේ විධි විධාන ප්‍රකාර අංක 5552 යටතේ වෘත්තීය සමිති ලේකම් කාර්යාලයේ ලියා පදිංචි ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ විශ්වවිද්‍යාල සහ අනුබද්ධ විශ්වවිද්‍යාල තුළ ක්‍රියාත්මක වන ජාතික වෘත්තිය සංවිධානයකි.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික නිලධාරින්ගේ සංගමයේ ව්‍යවස්ථාවයි.

**I. කොටස**

**නම සහ කාර්යාලය**

a) මේ සංගමයේ නම ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය තාක්‍ෂණික නිලධාරින්ගේ සංගමයයි.මින් පසු එය සංගමය යනුවෙන් සදහන් වේ.

b) සංගමයේ ලියාපදිංචි කාර්යාලය සහ සංගමයේ කාර්යයන් සදහා රැස්වන ස්ථානය ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හෝ සංගමයේ කළමණාකරණ කමිටුව තීරණය කරන වෙනත් ස්ථානයකි.

c) සංගමයේ නිල ලාංඡනයක් ඇත.එයින් “ග්‍රාන්ථාරූඪව ඇති විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපනයේ ආලෝකය,ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි අප සැම එක්සත්ව අපගේ අයිතීන් වෙනුවෙන් සහ වෘත්තිය අභිවෘද්ධිය වෙනුවෙන් නැගී සිටිමින් සමස්ථ ලෝකයටත් ඉන් ඔබ්බටත් රැගෙන යාමට උපකාරි වි දීප්තිමත් සහ අරුණාලෝකවත් අනාගතයක් වෙනුවෙන් කැපවීමට මෙම ලාංඡනය යටතේ එක්රොක් වන බව”ප්‍රකාශිත වේ.

එම නිල ලාංඡනය ව්‍යවස්ථාවේ උප ලේඛනය (II) යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

d) සංගමයට නිල බැනරයක් ඇත.එය සංගමයේ නාමයෙන් සමස්ථ විශ්වවිද්‍යාල සාමාජිකත්වය එක්රැස් වන සියලු අවස්ථාවන්හිද නිසි ස්ථානයන්හි ප්‍රදර්ශනය කළ යුතුය.
එහි භාරකරු වන්නේ සංගමයේ කළමණාකාර කමිටුව අනුමත කළ විධායක කමිටු සාමාජිකයෙකු හෝ සම්බන්ධිකරණ කාර්යාලය භාරව සිටින නිලධාරියාය.

e) සංගමය සම්බන්ධීකරණ කාර්යාලයක් පිහිටවනු ලැබේ.සම්මන්ත්‍රණ හා සාකච්ඡා පැවැත්විය හැකි පරිදිත් සාමාජිකයන්ට නේවාසික පහසුකම් ලබා ගත හැකි පරිදිත් එහි පහසුකම් ලබාගත හැකි පරිදිත් එහි පහසුකම් ඇති කරනු ඇත.එය පේරාදෙණිය විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කොට පිහිටවනු ඇත.

**II. කොටස**

**අරමුණු සහ ප්‍රස්තුත**

සමිතියේ අරමුණු සහ ප්‍රස්තුත පහත සදහන් වේ.

a) ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්‍ෂණික නිලධාරි,මාණ්ඩලික තාක්‍ෂණික නිලධාරි,තාක්‍ෂණික නිලධාරි දන්ත හෙදි,ඖෂධවේදි,හෙදි,වැඩ අධිකාරි,ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්‍ෂණික නිලධාරි .... ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල සහ අනුබද්ධ විශ්වවිද්‍යාල සේවකයන්ගේ සම්පූර්ණ සංවිධානයක් ඇති කිරිම.

b) එහි සාමාජිකයන්ගේ අපේක්ෂාවන් ,සංගමයේ අයිතවාසිකම් සහ වරප්‍රසාදයන් පිළිබදව අවධානයෙන් සිටිම,නගා සිටුවිම,ආරක්ෂා කිරිම සහ ඉදිරියට ගෙන යාම.

c) සාමාජිකයන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීම.

d) පහත සඳහන් සුභසාධනයන් වලින් යමක් හෝ සියල්ලම සාමාජිකයන්ට ලබා දීම.

   i. ඔවුන්ගේ සේවය සම්බන්ධයෙන් අයුතු බලපෑම්වලට අසුවූවිටදී හෝ වෘත්තිය අරගල වලදී සහනය හෝ එවැනි වෙනත් ආධාර.

   ii. ඔවුන්ගේ සේවය සම්බන්ධයෙන් නීතිමය ආධාර සහ අවශ්‍යවු විට නීතිමය උපදෙස්.

e) සේව්‍යායා සහ සේවකයා අතරේදි සංගමය සහ වෙනත් වෘත්තිය සංගම් අතරේද,සංගමයේ සාමාජිකයන් සහ ඔවුනොවුන් අතරේද,සාමාජිකයෙකු හා වෙනත් සාමාජිකයන් අතරේද සම්බන්ධතාවය විධිමත් කිරීම.

f) වෘත්තිය අරගල වලදී සාමාජිකයන් වෙනුවෙන් නියෝජනය කිරීම.

g) වෘත්තිය යහපත සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

## III. කොටස
## සාමාජිකත්වය

a) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයන්හි සහ අනුබද්ධ විශ්වවිද්‍යාලයන්හි ,තාක්ෂණ විද්‍යාත්මක සේවාවන් ඉටුකිරීම සඳහා සේවයට බැඳී සිටින සමතත්වයන්හිලා සැලකිය හැකි වයස අවුරුදු 18 ට වැඩි ස්ත්‍රී/පුරුෂ සියලු ස්ථිර සේවකයන්ට සංගමයේ සාමාජිකත්වය විවෘතව පවතී.සාමාජිකත්වය ලබා දීමට පිණිස සලකා බලන තනතුරු කිහිපයක නාමාවලායක් උපලේඛනය
   (I) යටතේ ඉදිරිපත් කෙරේ.

b) සාමාජිකත්වය ඉල්ලන සේවකයා කළමණාකරණ කමිටුව මගින් පිළියෙල කර තිබෙන ආකෘතිය ප්‍රකාර ඉල්ලුම්පතක් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.ඔහු/ඇය සංගමයේ සාමාජිකයෙකු වශයෙන් බඳවා ගනු ලබන්නේ කළමණාකරණ කමිටුව එම අයදුම්පත අනුමත කලේනම් පමණි.
   එවැනි ඕනෑම අයදුම් පතක් වෙනුවෙන් අවසාන තීරණය කළමණාකරණ කමිටුව සතු වන්නේය.

c) බැඳීම් සහ යුතුකම් අයිතිවාසිකම් සහ වරප්‍රසාද සියලු සාමාජිකයන්ට හිමි වේ.

d) ව්‍යවස්ථාවේ ඕනෑම කොන්දේසියක් කඩකිරීමේ වැරදිකරුවු ඕනෑම සාමාජිකයෙක්, සාමාජිකයන්ගේ මහ සභා රැස්මවීමක් ඉදිරිපිට එම සාමාජිකයාගේ නිදහසට කරුණු ප්‍රකාශ කිරීමෙන් පසු මහ සභාව විසින් ගන්නා තීරණයකට යටත්ව,සාමාජිකත්වය අත්හිටු වීමට කළමණාකරන කමිටුවට බලය තිබේ.

e) ගෞරව හෝ තාවකාලික සාමාජිකයන් නොමැත.

f) සියළුම සාමාජිකයන් තමා නියෝජනය කරන ප්‍රමුඛතම සංගමය පිළිබඳ සිය නියෝජිත සහ විශ්වවිද්‍යාල ලේකම් වෙත පිටපත් තුනකින් යුතුව ලිඛිත ප්‍රකාශයක් කළ යුතුය.
   එම ලිඛිත ප්‍රකාශය උප ලේඛනය (III) වශයෙන් ඉදිරිපත් කෙරේ.

g) අරමුණු සහ ප්‍රස්තුත වලට එරෙහිව හෝ ව්‍යවස්ථාවේ කොන්දේසි කඩකරන හෝ ඕනෑම සාමාජිකයෙකුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමේ බලය කළමණාකරණ කමිටුව සතුවේ.එහෙත් එම තීරණය ගත යුත්තේ කළමණාකරණ කමිටුව විසින් නම් කරන විධායක කමිටුවට අයත් නොවන තිදෙනෙකුගෙන් සමන්විත විනය කමිටුවක් විසින් කරනු ලබන නිර්දේශයන්ට යටත්වය.

h) ඉහත සඳහන් වගන්තියේ සඳහන් විෂමාචාරයේ යෙදී ඇති බවට නිර්දේශ කරන අයෙකුගේ සාමාජිකත්වය තාවකාලිකව අත්හිටු විය හැක.
   එහෙත් එය සිදුකල යුත්තේ කළමණාකරන කමිටුවේ බහුතර තීරණයක් ලෙස ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුවය.

## IV. කොටස
## නිලධාරී මණ්ඩලය සහ කළමණාකරණ කමිටුවේ සංයුතිය

a) වාර්ෂික මහ සභා රැස්වීමේ සාමාජිකයන්ගේ ඡන්දයෙන් පත්කර ගන්නා පහත සදහන් නිලධාරින්ගේන් නිලධාරි මණ්ඩලය සමන්විත වන අතර ,ඔවුන්ගේ සේවා කාලය ,යම් හෙයකින් කලින් වෙනස් තීරණයක් ගනු නොලැබුව හොත්,ඊළග වාර්ෂික මහා සභා රැස්වීම තෙක් දික්වේ.

සභාපති

උප සභාපති

ප්‍රධාන ලේකම්

උප ලේකම්

විශ්වවිද්‍යාල ලේකම්වරු(සෑම විශ්වවිදයාලකින්ම නියෝජනය වන පරිදි එක් අයෙකු බැගින්)

භාණ්ඩාගාරික

නිල වාර්තා සංස්කාරක සහ

නීති උපදේශක(සංගමයේ සාමාජිකයෙකු වන අවස්ථාවලදි)

ඉහත (a) සදහන් සභිකයන් විශ්වවිද්‍යාල වල ලේකම් වරුන් සියළු දෙනා සංගමයේ විධායක කමිටුව යනුවෙන් හදුන්වනු ලැබේ.පීඨ නියෝජිතවරුන්ද ඇතුළුව ඉහත සදහන් සියළු නිලධාරින් ඒකාබද්ධ කමිටුව ලෙස ක්‍රියා කරනු ඇත.

b) ඉහත සදහන් නිලධාරින් සහ වාර්ෂික මහා සභා රැස්වීමේ සාමාජිකයන්ගෙන් පත් කර ගන්නා,සෑම විශ්වවිද්‍යාලයකම සෑම පීඨයක්ම නියෝජනය වන පරිදි එක් පීඨ නියෝජිතයෙකු බැගින් වන පරිදි කළමණාකරණ කමිටුව සමන්විත වේ.නියෝජිතයෙකු ඒකාබද්ධ කමිටු රුැස්වීමට නොපැමිණෙන අවස්ථාවක ඔහු/ඇය වෙනුවෙන් නියෝජිතයා හෝ අදාළ ආයතනයේ බහුතර සාමාජිකත්වය නම්කොට අනුමත කළ සාමාජිකයෙකු හට කමිටුව ඉදිරියේ කරුණු දැක්විය හැකි වුවද එකී කරුණු සාකච්ඡා කිරිමෙන් අනතුරුව රුැස්වීම් ශාලාවෙන් නික්ම යා යුතුය.තවද ඔහු/ඇය හට ඡන්ද බලය හිමි නොවේ.

c) නීති උපදේශකවරයා සංගමයේ සාමාජිකයෙකු වන කල්හි වුවද නීතිවේදියකු වශයෙන් පෙනි සිටිය යුත්තේ සහ/හෝ නීති උපදෙස් සංගමය වෙත ලබාදිය යුත්තේ කවර අවස්ථාවලදි යන්න ඒකාබද්ධ කමිටු රුැස්විමකදි තීරණය කළ යුතුය.

d) නීති උපදේශකවරයා සංගමයට පරිබාහිර පුද්ගලයෙකු වන කල්හි සංගමයේ විධායක කමිටුවේ සාමාජිකයෙකු බවට පත් නොවන අතර නීති උපදෙස් ලබා ගැනිම සහ/හෝ නීති වේදියකු වශයෙන් නඩු වලට පෙනි සිටිමට ආරාධනා කිරිම ඒකාබද්ධ කමිටු රුැස්විමකදි සිදුවිය යුතුය.

e) නීති උපදේශකවරයා නීති උපාධිධාරියෙකු විය යුතු අතර කම්කරු නීති පිළිබද හදාරා සිටිය යුතුය.ඔහුගේ වගකිම වන්නේ සාමාජිකයන්ගේ සහ සංගමයේ කටයුතු වලදි නීතිමය ආවරණයක් ඇති කිරිම පිණිස එකී පාර්ශවයන් වෙනුවෙන් අධිකරණ ආයතන තුළ පෙනි සිටිම හා නීතිමය ලියවිලි පාලන අධිකාරින්ට හා අධිකරණය වෙත ඉදිරිපත් කිරිමයි.

f) සංගමයේ කළමණාකරණ කමිටුවේ නිලධාරියෙකු වශයෙන් පත්වන කිසිවෙකු වෙනත් වෘත්තිය සංගමයක විධායක සංගමයේ හෝ ඒකාබද්ධ කමිටුවේ (මධ්‍යම කමිටුවේ) නිලධාරියකු හෝ නියෝජිතයකු නොවිය යුතුය.සියලු දේශපාලන වෘත්තිය සමිතිවල නිල තලද ඉහත සීමාවන්ට යටත් වේ.

g) කළමණාකරණ කමිටුවට පත්වන සියලුම නිලධාරින් සිය ප්‍රථම ඒකාබද්ධ කමිටු රුැස්වීම් වාරයේදි තමා සාමාජිකත්වය දරණ සෙසු වෘත්තිය සංගම් සහ ඒවායේ උසුලන ධූරයන් පිළිබදව සමස්ත සභාව ඉදිරියේදි වාචික ප්‍රකාශ කළ යුතුය.

h) ස්ථාවර කමිටු

සංගමයේ නිලධාරින් සහ සාමාජිකයන් අතුරෙන් කළමණාකරණ කමිටුව මගින් පත් කරනු ලබන පහත සදහන් ස්ථාවර කමිටු හත එක් එක් වර්ෂයක් සදහා පිහිටවිය යුතුය.

1. නීති,ව්‍යවස්ථා කටයුතු අයිතිවාසිකම් සහ වරප්‍රසාද

2. වැටුප්,බදවා ගැනීමේ පටිපාටිය සහ සේවා කොන්දේසි
3. සංගමයේ නිල පුවත් ප්‍රකාශනය සහ සාමාජික තොරතුරු ලේඛණය
4. වාර්ෂික මහ සභා රැස්වීම සංවිධානය සහ අනුග්‍රහකත්ව ලබා ගැනීම
5. පුහුණු පර්යේෂණ සහ වැඩමුළු
6. වෘත්තිය සෞඛ්‍ය සහ ආරක්ෂා
7. මුදල් ලැබීම් අධීක්ෂණය කිරීමේ කමිටුව

ස්ථාවර කමිටුවේ සභාපති සහ ලේකම් (කැඳවුම්කරුට) අමතරව එක් කමිටුවක් සඳහා තවත් සාමාජිකයන් හත් දෙනෙකු ඇතුලත් විය යුතුය.

i) කළමණාකරණ කමිටුවේ ප්‍රධාන නිලධාරින් සඳහා කමිටු ලේකම්වරුන් පත් කිරිම සංගමයේ සභාපති ප්‍රධාන ලේකම්,භාණ්ඩාගාරික සහ උප සභාපති යන තනතුරු දරන්නට බලතල සහ කාර්යය හා කර්තව්‍යයන්ට යටත්ව ඔවුන් හට සහය විම පිණිස කමිටු ලේකම්වරුන් දෙදෙනෙක් සාමාජිකයන් අතුරින් පත් කිරිම සඳහා කළමණාකරණ කමිටුවට බලතල ඇත. මෙම පත් කිරිම ප්‍රධාන නිලධාරිනගේ නිර්දේශයන්ට යටත්ව වාර්ෂික මහ සභා රැස්වීමේදී සිදුකල යුතුය.කමිටු ලේකම් ප්‍රධාන නිලධාරින්ගේ මග පෙන්වීම සහ හා පාලනයට යටත්ව අතර ඒකාබද්ධ කමිටු,විධායක කමිටු,ස්ථාවර කමිටු,රැස්වීම් වලදී හා අනෙකුත් අවශ්‍ය අවස්ථාවනහිද ලිපි ලේඛණ සැකසිම,මුද්‍රණය හා බෙදා හැරිම යන කාර්යයන් සඳහා සහය විම ඔහුගේ/ඇයගේ වගකිම වේ.

## V. කොටස

## රැස්වීම් පැවැත්වීම සහ වාර්තා සටහන් කර තැබීම.

a) සමිතියේ වාර්ෂික මහ සභා රැස්වීම අප්‍රේල් හෝ මැයි මාසයේ පැවැත්විය යුතු අතර එය සැප්තැම්බර් මාසයට වඩා ප්‍රමාද නොවිය යුතුය. ඒ සඳහා ඝන පූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/4 කකි.
b) වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය,රැස්වීම් පැවැත්වීමට තීරණය කර ඇති දිනට 14 දවසකට කලින් සාමාජිකයන්ට යැවිය යුතුය.
c) විශේෂ කාරණයක් හෝ කරුණු ගැන සාකච්ඡා කිරිමට සභාපතිට හෝ කළමණාකාර කමිටුවේ සාමාජිකයන් පස් දෙනෙකුට හෝ සමිතියේ මුළු සාමාජිකත්වයෙන් 1/3 කට හෝ විශේෂ මහ සභා රැස්වීමක් කැඳවිම සඳහා ඕනෑම වෙලාවක ප්‍රධාන ලේකම්ගෙන් අයදුම් කල හැක.
d) එවැනි රැස්වීමක් කැඳවිම සඳහා සති දෙකකට කලින් දැන්වීමක් ලියවිල්ලකින් ප්‍රධාන ලේකම්ට දිය යුතුය.
e) විශේෂ රැස්වීමක නිවේදනයක් රැස්වීම පැවැත්වීමට නියමිත දිනට හත් (7) දවසකට කලින් සාමාජිකයන්ට යැවිය යුතුයි.
f) වාර්ෂික මහා සභා රැස්වීමකදී සාකච්ඡා සඳහා වු යෝජනා ,ව්‍යවස්ථා සංශෝදන සඳහා යෝජනා සහ නිලධාරින් සඳහා නාමයෝජනා,රැස්වීමේ නිවේදනයෙන් සති දෙකක් ඇතුලත සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාලයීය ලේකම් වරුන්ට ඉදිරිපත් කල යුතුය.
g) විශේෂ මහා සභා රැස්වීමකට ඝනපූර්ණය වාර්ෂික මහා සභා රැස්වීමක මෙන්ය.එනම් මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/4 කකි.
h) වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමකදී ඇමතුම් මේසය හා පසුපස තිරය ඉදිරියෙන් පහත සඳහන් බැනර සහ ඇතිරිලි ප්‍රදර්ශනය විය යුතුය.
   1. සංගමයේ නිල බැනරය
   2. වාර්ෂික මහ සභා රැස්වීම් සංකේතවත් කරන සංශෝධිත බැනරය
   3. ඇමතුම් මේසය ආවරණය කරන ඇතිරිල්ල
i) විශ්වවිද්‍යාල ලේකම් මුලසුන හොබවන විශ්වවිද්‍යාලයීය රැස්වීමකදී හෝ නියෝජිතයෙකු මුලසුන හොබවන පීඨ/ආයතන/අංශ රැස්වීමකදී එකී සාමාජිකත්වයේ බහුතර කැමැත්ත

දක්වන වැදගත් තීරණ ගෙන ප්‍රධාන ලේකම් වෙත දැන්විය හැකිය.එහෙත් ඒ සදහා ගණ පූර්ණය අදාළ නිලධාරියා නියෝජනය කරන සාමාජික සංඛ්‍යාවෙන් 2/3 කි.

**VI. කොටස**

**සංගමයේ සාමාන්‍ය කළමණාකරණය**

a) සංගමයේ කළමණාකරණය IV කොටස යටතේ තෝරා පත් කල කළමණාකරණ කමිටුවට හිමිය.මුළු සාමාජිකත්වයට සම්බන්ධ සියළුම පොදු කාරණා වලදි ප්‍රධාන ලේකම් සියළුම සියළුම විශ්වවිද්‍යාල ලේකම්වරු සමග සම්බන්ධිකරණයෙන් ක්‍රියා කරනු ඇත.විශ්වවිද්‍යාලයීය ලේකම්වරු ලියකියවිලි වල පිටපත් ප්‍රධාන ලේකම්ට විගසම ඉදිරිපත් කල යුතුය.

b) ප්‍රධාන ලේකම් වෙනුවෙන් උප ලේකම් සියළුම රැස්වීම්වල වාර්තා සටහන් කර ඊළග රැස්වීමට පෙර කමිටු සාමාජිකයන් වෙත එවා එම රැස්වීමේදි ස්ථිර කර ගතයුතුය.

c) අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු කළමණාකරණ කමිටු රැස්වීමකට ඝනපූර්ණය හත් දෙනෙකි.

d) කමිටු සංගමයේ සියළුම කාර්යයන් නීතිරීති වලට අනුකූලව කල යුතුය.ඉතා භාරදූර කරුණු මහ සභා රැස්වීමකට වාර්තා කල යුතුය.

e) රැස්වීමකදි ඡන්දය දිම අත් එසවිමෙන් වන නමුත් සුවිශේෂ රැස්වීමකදි බහුතර කැමැත්ත මත රහස් ඡන්දයක් පැවැත්විය හැක.

f) මහා සභා රැස්වීමකදි වලංගු කිරීම සඳහා වහාම ඉදිරිපත් කිරිමකට යටත්ව වෘත්තිය සමිති අඥාපනතට අනුකූලව,ව්‍යවස්ථාවට අවශ්‍ය වෙනස්කම් ඇති කිරීමට කමිටුවට බලය තිබේ.

g) නොපැමිණිමට පිළිගත හැකි කරුණක් නොමැතිව ,නොකඩවා රැස්වීම් තුනකට නොපැමිණි සභිකයෙකුගේ කමිටු සමාජිකත්වය නැතිවේ.ප්‍රධාන ලේකම් එවැනි සභිකයන් පිළිබද විමසිල්ලෙන් සිටිය යුතුය.

h) සභාපති හෝ ඔහුගේ නොපැමිණිමෙන් උප සභාපති හෝ දෙදෙනාම නැතිනම් ,ඒ අවස්ථාවේ තෝරා පත්කරගත් සාමාජිකයෙකු මුලසුන හොබවනු ඇත.

i) සංගමයේ යහපතට අහිතකර අන්දමින් ක්‍රියා කරන ඕනෑම සාමාජිකයෙකු හෝ භාරකරුවෙකු හෝ කාර්යාලයීය විගණකාධිගේ සාමාජිකත්වය,සම්බන්ධතාවය අත් හිටු විමට කමිටුවට බලය තිබේ.නමුත් මහ සභා රැස්වීමකට යෝජනාවක්,වලංගු ඡන්දදායික සාමාජිකයින්ගෙන් 2/3 ක ඡන්දයෙන් අනුමත විමෙන් හැර නෙරපා දැමිය නොහැකිය.

j) කළමණාකරණ කමිටුව වර්ෂය තුළ කරන ලද කාර්යයන්වල වාර්ථාවක් සහ විගණනයට ලක් කොට සහතික කල අයවැය වාර්ථාවක් වාර්ෂික මහ සභා රැස්වීමට අනුමැතිය පිණිස ඉදිරිපත් කල යුතුය.

k) ප්‍රධාන ලේකම් විසින් සමස්ථ සාමාජිකත්වය පිළිබද තොරතුරු ලේඛණයක් නිතිපතා පවත්වාගෙන යා යුතුය.විශ්වවිද්‍යාල ලේකම්වරුන්ට ස්වකීය ආයතනයේ සාමාජිකත්වය පිළිබද එවැනිම ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.විශ්වවිද්‍යාල ලේකම්වරුන්ද ස්වකීය ආයතනයේ සාමාජිකත්වය පිළිබදව එවැනිම ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.

l) සංගමය වෙනුවෙන් සියළුම ලිපි ලේඛණ පවතිවාගෙන යා යුතු ප්‍රධාන නිලධාරියා ප්‍රධාන ලේකම් වන අතර පොදු කරුණු වලදි නිවේදන නිකුත් කල හැක්කේ සභාපතිට හෝ ප්‍රධාන ලේකම්ට පමණි. එහෙත් වෘත්තීය සමිති ක්‍රියා මාර්ග වලදී විශ්වවිද්‍යාල ද පීඨ නියෝජිතයින්ටද එවැන්නක් කල හැකි වන අතර, එය සංගමයේ කමිටුව අනුමත කල කරුණු වලට පරිබාහිර හෝ පටහැණි හෝ නොවිය යුතුය.

m) සංගමය වෙනුවෙන් සියළුම පොදු කරුණු වලදී විශ්වවිද්‍යාල සහ ඊට සම්බන්ධ සියළුම ආයතන සමග ලිඛිත සම්බන්ධතා පැවැත්විය යුත්තේ ප්‍රධාන ලේකම් හෝ සභාපති යන දෙදෙනා පමණි.

n) සියළුම සාකච්ඡා සහ රැස්වීම් වලදී සටහන් තැබීම සහ වාර්තා පිළියෙල කිරීම කලයුත්තේ උප ලේකම් විසිනි. එසේම ප්‍රධාන ලේකම් යවන අත්‍යාවශ්‍ය ලිපි ලේඛන වල ඡායා පිටපත්

සෙසු සභිකයන්ට ඔහු/ඇය විසින් ලබා දිය යුතු අතර ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ ලිපි ගොනුවද පවත්වා ගෙන යා යුතුය.

o) සාමාජිකයින් විසින් සිය ඉල්ලීම් සහ යෝජනා ඉදිරිපත් කල යුත්තේ පීඨ නියෝජිත සහ විශ්වවිද්‍යාලයීය ලේකම් හරහා ප්‍රධාන ලේකම් වෙතටය. ප්‍රධාන ලේකම් විසින් එවා සභාගත කිරීම පිණිස න්‍යාය පත්‍රයට ඇතුලත් කරනු ලැබේ. ප්‍රධාන ලේකම් වෙත කෙලින්ම එවන ලිපි සහ නිර්නාමික ලිපි ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

p) ව්‍යවස්ථාවට ඇතුලත් නොකොට වුවද සංගමයේ අභිවෘද්ධිය පිණිස සහ සාමාන්‍ය කළමණාකරණය විධිමත් කිරීම පිණිස අවශ්‍යවිය හැකි රීති සහ සම්ප්‍රදායන් කළමණාකරණ කමිටුව විසින් පවත්වාගෙන යා හැක.

## VII. කොටස

## සංගමයේ අරමුදල්

a) සංගමයේ අරමුදල් පහත සඳහන් 3 වන උපවගන්තියට යටත්ව, කළමණාකරණ කමිටුව අනුමත කල බැංකුවක තැන්පත් කල යුතුය. අරමුදලින් කරන සියළුම ආයෝජන වලට සහ ආපසු ගැනීම් වලට කළමණාකරණ කමිටුවේ පූර්ව අනුමැතිය ලබා ගෙන තිබිය යුතුය. හදිසි අවශ්‍යතාවයකදී සංගමයේ යම් කාර්‍යයක් සම්බන්ධයෙන් සභාපතිගේ හෝ සංගමයේ ප්‍රධාන ලේකම්ගේ හෝ උපදෙස් පිට රුපියල් 10,000/= කට නොවැඩි මුදලක් කමිටුවේ පූර්ව අනුමැතිය නොලැබ භාණ්ඩාගාරික විසින් ආපසු ගැනීම නිත්‍යානුකුලය. එවැනි ආපසු ගැනීම් සහ වැය කිරීම් කමිටුවේ දැන ගැනීම සඳහා ඊළඟ රැස්වීමට ගෙන යා යුතුය. අරමුදලින් VII කොටසේ (b) උප වගන්තිය යටතේ ආපසු ගැනීම් හැර, සියළු මුදල් යෙදවීම් සහ ආපසු ගැනීම් වලදී කමිටුවේ පූර්ව අනුමැතිය තිබිය යුතුය. සෑම ආපසු ගැනීමේ ආකෘති පතක් සහ චෙක්පතක් භාණ්ඩාගාරික සහ පහත සඳහන් අයගෙන් කෙනෙක් අත්සන් කල යුතුය.

| | |
|---|---|
| සභාපති | (භාරකරුවන් වශයෙන්) |
| උප සභාපති | (භාරකරුවන් වශයෙන්) |
| ප්‍රධාන ලේකම් | (භාරකරුවන් වශයෙන්) |

b) සංගමයේ අරමුදල් ප්‍රයෝජනයට ගත හැක්කේ II කොටසේ නියමයන් පරිදි අරමුණු සහ කාරණා දියුණු කිරීමට සහ වාර්ෂක/හදිසි/විශේෂ මහා රැස්වීම් ඇතුළු සහ සාකච්ජා සඳහා වියදම් පියවීමට පමණි.

c) භාණ්ඩාගරික තමා ළඟ සංගමයේ අරමුදලින් රුපියල් 2,000/= වැඩි කිසි මුදලක් තබා නොගත යුතුය. නමුත් ඊට වැඩි සෑම මුදලක්ම කළමණාකරණ කමිටුව අනුමත කළ බැංකුවක තැන්පත් කළ යුතුය.

d) සභාපතිගේ උපදෙස් පිට, කමිටුවේ අනුමැතිය නොගෙන, සංගමයේ යම් කාර්‍යයක් සම්බන්ධව භාණ්ඩාගාරික විසින් රුපියල් 500/=ට නොවැඩි මුදලක් වැය කිරීම නීත්‍යානුකුලවය.

e) විශ්වවිද්‍යාල ලේකම් වරුන්ට අදාල කටයුතු සඳහා සුළු මුදල් වශයෙන් එක් වරකදී රුපියල් 500/=ක් භාණ්ඩාගාරික විසින් ලබා දෙනු ඇත.

f) අරමුදල පවත්වාගෙන යන බැංකුවේ නිසි බලධාරියාට ලිඛිතව, සභාපති හෝ ප්‍රධාන ලේකම් විසින් දැනුම් දුන් පසුව උප ලේකම්වරයාට භාණ්ඩාගාරිකවරයා සමග සංගමයේ අරමුදල් වලින් අවශ්‍ය මුදල් ආපසු ගැනිමට ඒකාබද්ධව කටයුතු කළ හැකිය.

g) අරමුදල් වලින් සංගමයේ යහපතට හෝ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම උදෙසා භාණ්ඩ මිලදී ගැනිමේදී රජය පිළිගත් ටෙන්ඩර් ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු තළ යුතුය.

h) කිසියම් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් සංගමයේ යහපතට හෝ සාමාජිකයන්ගේ අභිවෘද්ධියට පිරිනමන සියළුම අනුග්‍රහකත්ව සහ මුදල් පරිත්‍යාග භාණ්ඩාගාරිකගේ නිල නමට සහ සංගමයේ අයිතියට බැර විය යුතුය.

i) නීතිවේදින් හට මුදල් ගෙවීම් සදහා සංගමයේ අරමුදල් යෙදවිය හැකි අතර ගෙවිය යුතු ප්‍රමාණය ගැන තීරණය කිරීමට විධායක සභාවට බලය ඇත.

## VIII. කොටස

**දායක මුදල්**

a) සාමාජිකයෙකුගේ වාර්ෂික දායකත්වය රුපියල් 1800/=ක් හෝ සංගමය විසින් කලින් කලට නියම කරන එවැනි මුදලක් වන අතර එය මාසිකව ගෙවිය හැකි.එම මිල කුවිතාන්සි නිකුත් නොකරන වේතන ලැයිස්තුවෙන් අඩු කර ගනු ලැබේ.

b) විශ්වවිද්‍යාලයීය ලේකම්වරුන් විසින් සංගමයට කරන සෑම ගෙවීම් වලටම කුවිතාන්සි නිකුත් කරනු ලැබේ.

c) මුදල් වර්ෂය කෙළවරදී හය මසකට වැඩි සාමාජික මුදලක් හිගව ඇති සෑම සාමාජිකයෙකුගේම සාමාජිකත්වය අත්හිටවන අතර සංගමයේ කිසිදු ප්‍රතිලාභයකට හෝ රැස්වීමකට සහභාගිවීමට හෝ ඡන්දය දීමට හෝ හිමිකම් නොලැබේ. සාමාජිකයන්ට දඩ පවරනු නොලැබේ.

d) අවශ්‍ය විටකදී විශේෂ දායක මුදල් ඉල්ලා සිටීමට කමිටුවට බලය ඇත.

**IX. කොටස**

**විගණනය කිරීම සහ ගිණුම් පොත් පරීක්ෂා කිරීම**

a) ආඥාපනත යටතේ සකස් කර තිබෙන රෙගුලාසි වල විසිවන රෙගුලාසිය පරිදි සංගමයේ ගණන් හිලව් පරීක්ෂා කිරීම සඳහා වෘත්තිය සංගම් රෙජිස්ටාර් අනුමත කර ඇති පරීක්ෂක වරයෙකු කමිටුව විසින් තෝරාපත් කල යුතු අතර එම පරීක්ෂා කිරීම් වාර්ෂික මහ සභා රැස්වීමට කලින් හරියාකාරව නිම කල යුතුය.

b) විශ්වවිද්‍යාල ලේකම් වරුන්ට සතියක දැන්වීමක් ලියවිල්ලකින් දීමෙන් ,සංගමයේ අරමුදල් ගැන සැලකිල්ලක් දක්වන ඕනෑම සාමාජිකයෙකුට හෝ කෙනෙකුට විශ්වවිද්‍යාල ලේකම්වරුන්ට සතුව තිබෙන ගණන් හිලව් පොත් සහ සංගමයේ සාමාජිකයන්ගේ නාම ලේඛණය සතියේ ඕනෑම වැඩ කරන දිනයකදී පරීක්ෂා කිරීමට අයිතියක් තිබේ.

c) සංගමයේ මුදල් වර්ෂය අප්‍රේල් 1 වෙනිදා සිට මාර්තු 31 වෙනිදා තෙක්ය.

d) වාර්ෂික අයවැය වාර්ථාව සෑම වර්ෂයකම මාර්තු 31 වෙනිදා සිට දින 60 ක් ඇතුළත හෝ වාර්ෂික මහ සභා රැස්වීමට අවම වශයෙන් දින 14 කට පෙර විගණකවරුන් විසින් සහතික කල පසුව මුද්‍රිත පිටපත් වශයෙන් සියළු සාමාජිකයන් වෙත භාණ්ඩාගාරික විසින් ලබාදිය යුතුය.

**X. කොටස**

**භාරකරුවන්**

a) වාර්ෂික මහා සභා රැස්වීමේදී අඩු වශයෙන් භාරකරුවන් හතර දෙනෙක් පත්කර ගත යුතුය.ඔවුහු දැනට සංගමයේ සභාපති,උප සභාපති,ප්‍රධාන ලේකම් සහ භාණ්ඩාගාරික වශයෙන් නිල දරන්නා වු අයවෙති.ඔවුන් කළමණාකරණ කමිටුවේ උපදෙස් අනුව සංගමයේ අරමුදල් සහ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කරනු ඇත.

**XI. කොටස**

**නිලයෙන් පහ කිරීම**

a) නිලධාරියෙක්,ගණන් පරීක්ෂක වරයෙක් හෝ භාරකරුවෙකු මහා සභා රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේන් අඩු වශයෙන් 2/3 ක ඡන්දයෙන් අනුමත වු චෝදනාවකින් හැර,නිලයෙන් පහකළ නොහැක.නමුත් කමිටුවට එවැනි පුද්ගලයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවා ඔහුගේ නඩුව වැඩිදුර ක්‍රියා කිරීමට හෝ ස්ථිර කිරීමට හෝ මහ සභා රැස්වීමකට ඉදිරිපත් කිරීමට බලය ඇත.මහ සභා රැස්වීම් දෙකක් අතරේ ඇතිවන පුරප්පාඩුවක් විධායක කමිටුවට පිරවිය හැක.

b) විශ්වවිද්‍යාලයීය ලේකම් කෙනෙකු පහකළ හැක්කේ ඊට අදාළ විද්‍යාලයේ මහ සභා රැස්වීමකදී ඊට පැමිණෙන සාමාජිකයන්ගෙන් අඩු තරමින් 2/3 ක ඡන්දයෙන් ස්ථිර වු යෝජනාවකිනි.ප්‍රධාන ලේකම් එවිට ඔහුට/ඇයට යවා ඇති එවැනි තීරණයෙන් සති දෙකක් ඇතුළත විධායක කමිටු රැස්වීමක් කැඳවිය යුතුය.විධායක කමිටුව එහිදී විශ්වවිද්‍යාල මහ

සභා රැස්වීමේදී නාම යෝජනා කරන ලද තැනැත්තා පත් කරමින් එම පුරප්පාඩුව පුරවනු ලැබේ.

c) පීඨ නියෝජිතවරයෙකු නිලයෙන් පහ කිරීම හා අලුතින් ඒ වෙනුවට කෙනෙකුන් පත් කිරීම කළ යුත්තේද ඉහත (b) හි සදහන් ආකාරයටය.එහෙත් අලුතින් පනවන පීඨ නියෝජිතවරයෙකුගේ පත්වීම ස්ථිර කිරීමට ඊළග ඒකාබද්ධ කමිටු රැස්වීම සෑහේ.ඒ සදහා සති දෙකක් ඇතුළත අනිවාර්යෙන්ම රැස්වීමක් කැඳවිය යුතු නොවන්නේ විශ්වවිද්‍යාල ලේකම්වරයාට එම තනතුරේ වැඩ එතෙක් ආවරණය කළ හැකි බැවිනි.

d) පිළිගත හැකි හේතුවක් නොදක්වා නොකඩවා තුන් වතාවක් ඒකාබද්ධ කමිටු රැස්වීම් වලට නොපැමිණෙන සභිකයන් ඉවත් කරන ලද බව ඊළග ඒකාබද්ධ කමිටු රැස්වීම් වාරයේදී ප්‍රධාන ලේකම් විසින් නිවේදනය කළ යුතුය.

**XII. කොටස**
**දේශපාලන අරමුණු හෝ බලාපොරොත්තු**

a) වෘත්තීය සමිති ආඥාපනත යටතේ විධිවිධාන ප්‍රකාරව සංගමට කිසිදු දේශපාලන අරමුණක් හෝ අරමුදලක් නොමැත.

**XIII. කොටස**
**බලමණ්ඩල වලට අනුබද්ධ වීම**

a) සංගමය,සංගමයේ මහ සභා රැස්වීමකදී එම රැස්වීමට පැමිණි සාමාජිකයන්ගෙන් අවම වශයෙන් 2/3 ක ඡන්දයෙන් ඒකාබද්ධ වීම අනුමත වුවහොත් ශ්‍රී ලංකාවේ වෙනත් වෘත්තිය සංගමයක් සමග හෝ සංගම් සමග හෝ ඒකාබද්ධවීම නීත්‍යානකූල වේ.

**XIV. කොටස**
**විසුරුවා හැරීම සහ අරමුදල් නිදහස් කිරීම**

a) සංගමය විසුරුවා හැරීම සහ එහි අරමුදල් නිදහස් කිරීම කළ හැක්කේ ඒ සදහා කැඳවන ලද විශේෂ මහ සභා රැස්වීමකදී ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගෙන් අඩුම වශයෙන් 2/3 ක ඡන්දය දැම්මෙන් සහ දැමූ ඡන්ද වලින් අඩු වශයෙන් 3/4 ක් යෝජනාවට පක්ෂව ලැබීමෙන්ය.

b) XIV කොටසේ (a) වගන්තිය අනුව සංගමය විසුරුවා හැරීමේදී බැංකුවේ සහ භාණ්ඩාගාරික ළග තිබෙන සංගමයේ මුදල් සහ සංගමයට අයත් වෙනත් සියලු දේපල වෙන්දේසියේ විකිණීමෙන් ලබා ගන්නා මුදලින් සියළුම ණය මුදල් ගෙව්වාට පසු සංගමය විසුරුවා හරින ලද දිනය දක්වා සාමාජික මුදල් සම්පූර්ණයෙන් ගෙවා ඇති සාමාජිකයන් අතරේ ඉතිරි මුදල් සමව බෙදී යනු ඇත.

**XV. කොටස**
**අනුශාසක**

a) සංගමයේ අනුශාසක කෙනෙක් නොමැත.

**උපලේඛනය (I)**

ප්‍රධාන තාක්ෂණික නිලධාරි , ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණික නිලධාරි, මාණ්ඩලික තාක්ෂණික නිලධාරි , වැඩ ඉංජිනේරු, පරිගණක පද්ධති විශ්ලේෂක, ඉංජිනේරු ගුරු සහයක, පරිගණක වැඩ සටහන් සම්පාදක, හෙදි පාලිකා , වැඩ අධිකාරි, තාක්ෂණික නිලධාරි, දන්ත හෙදි, හෙදි, ඖෂධවේදි, විකිරණවේදි, ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණික නිලධාරි , විද්‍යුත් උපකරණ තාක්ෂණික නිලධාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක, ලිතෝ මුද්‍රණ ශිල්පි, ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු, ප්‍රොසෙස් කැමරා ක්‍රියාකරු, චිකිත්සාගාර

ඡායාරූප ශිල්පි, සැලසුම් ශිල්පි, වැඩ පරිපාලක, පරිගණක ක්‍රියාකරු, ගොවිපොළ පරිපාලක, ලිතෝ ප්ලේට් මේකර්, ගොවිපොළ කළමණාකරු, ඇඳීම් කාර්යාල සහකාර.

**උපලේඛනය (II)**

**ලාංඡනය**

**උපලේඛනය (III)**

……………………………………………………………………….

ප්‍රධාන ලේකම්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තාක්ෂණික නිළධාරීන්ගේ සංගමය

……………………………………………………………………….

## <u>නියෝජනය කරනු ලබන ප්‍රමුඛතම සංගමය පිලිබඳව ප්‍රකාශනය</u>

……………………………………………………………………….

පිහිටි ……………………………………………………………….

විශ්වවිද්‍යාලයේ ……………………………………………………………….

ආයතනයේ/පීඨයේ /ශාඛාවේ/ඒකකයේ/අංශයේ විධායක ශ්‍රේණියට/අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට/තාක්ෂණික ශ්‍රේණියට අයත්……………………………………………………………….

වශයෙන් සේවය කරන මා මාසික වැටුපෙන් දායක මුදල් ගෙවන අතර අංක 5552 යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තාක්ෂණික නිළධාරීන්ගේ සංගමයේ සාමාජිකයකු බව ඉඳුරාම ප්‍රකාශ කරමි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1999.01.25 වන දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 746 අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ සේවය කරන ඕනෑම අයකුට වෘත්තීය සමිති වාර්ෂික මහා සභා රැස්වීමකට සහභාගී වීමට රාජකාරී නිවාඩු හා විශ්වවිද්‍යාලයෙන් සපයනු ලබන ප්‍රවාහන පහසුකම් සපයනු ලබන්නේ ඔහු/ඇය සාමාජිකත්වය දරන වෘත්තීය සංගම් අතුරින් එක් ලියාපදිංචි වෘත්තීය සංගමයක වාර්ෂික මහා සභා රැස්වීමකට පමනක් බව මා හොදාකාරව දනිමි.

ඒ අනුව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තාක්ෂණික නිළධාරීන්ගේ සංගමය පමනක්/සහ……………………………………………………………….

යන වෘත්තීය සංගම්වල සාමාජිකත්වය දරන මා නියෝජනය කරනු ලබන මාගේ ප්‍රමුඛතම වෘත්තීය සංගමය ලෙස ……………………………………………………………….
නම් කරන අතර විශ්වවිද්‍යාලයෙන් සපයනු ලබන ප්‍රවාහන පහසුකම් හා රාජකාරී නිවාඩු මත මා සහභාගී වන්නේ එම සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමට බව අදාල සියළු දෙනාගේ දැනගැනීම පිනිස මෙයින් දන්වා සිටිමි.

නම :……………………………………………………………….

අත්සන :……………………………………………………………….

සාක්ෂි :.........................................................................

දිනය :.........................................................................

ආයතන/පීඨ/ශාඛා/ඒකක නියෝජිත ..........................................................................

විශ්වවිද්‍යාලයීය ලේකම් ..........................................................................